කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

## සමාජීය විද්‍යා පීඨය

දේශපාලන විද්‍යාව - POLS - E 2025

පෙරදිග හා බටහිර දේශපාලන චින්තනයේ වර්ධනය

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

01. දේශපාලන චින්තනය දේශපාලන න්‍යාය සහ දේශපාලන දර්ශනයෙන් වෙන්කර හඳුනා ගන්නේ කෙසේද?

02. දේශපාලනය, පුරවැසිභාවය, අධ්‍යාපනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ප්ලේටෝගේ සහ ඇරිස්ටෝටල්ගේ අදහස් සාකච්ඡා කරන්න.

03. තෝමස් ඇක්වයිනාස් විසින් නීතිය සහ රාජ්‍ය පිළිබඳව දක්වා ඇති අදහස් දක්වන්න.

04. "මැකියාවෙලි ආගම සහ සදාචාරය දේශපාලනයෙන් වෙන් කරන ලදී." අදහස් දක්වන්න.

05. මාක්ස්ගේ න්‍යාය පහත සඳහන් මාතෘකා දෙක යටතේ සාකච්ඡා කරන්න.

 1. ද්වන්ද්වාත්මක භෞතිකවාදය
 11. ඓතිහාසික භෞතිකවාදය

06. "ලෙනින්වාදය යනු අධිරාජ්‍යවාදී යුගයේ නිර්ධන පංති ආඥාදායකත්වය මත පදනම් වූ මාක්ස්වාදයයි." ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟවන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

07. ගාන්ධිගේ අවිහිංසාවාදී සංකල්පය අද යුගයට ගැලපෙන්නේද යන්න තක්සේරු කරන්න.

08. බෞද්ධ දේශපාලන චින්තනයේ මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.

09. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක් (02)** පිළිබඳව සටහන් ලියන්න.

 i. ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය
 ii. පොලීබියස්
 iii. ෆැසිස්ට්වාදයේ දාර්ශනික මූලයන්
 iv. අන්තෝනියෝ ග්‍රාම්ස්චි
 v. ජවහර්ලාල් නේරු

***********************************